ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය
නො. 762/4B, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.
දුරකථන/ ෆැක්ස්: 011 2884431
විද්‍යුත් තැපැල: forum4research@gmail.com

# නිවුන් පුවත්

කාණ්ඩ අංක 05 | මැයි 2009 | පිටු අංක 1 - 4

ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය 1997 දී ආරම්භ කරන ලද, වෘත්තීයවේදීන්ගේ ආයතනයකි. නිවුන් පුද්ගලයන් ඇසුරින් සෞඛ්‍ය ක්ෂේත්‍රවලට අදාළ ගැටලු හඳුනා ගෙන, එම ගැටලුවලට පිළියම් කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ පදනමින් රාජ්‍ය ප්‍රතිපත්ති නිවැරදි ලෙස සැකසීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ මානුෂීය මෙහෙවරකට උර දී සිටින, දේශීය පර්යේෂණ ආයතනයකි.

## අපේ විත්ති ...

### ජාන විද්‍යාගාරය වැඩ ඇරඹීමට ලෑස්තියි.



ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය තුළ ජාන විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සියලු කටයුතු සකස් කර අවසාන ය. මෙය අප ආයතනය ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි. ඉහළ තාක්ෂණික උපාංගයන්ගෙන් පරිපූර්ණ වූ (State-of-the-art) මෙම විද්‍යාගාරය මගින් රටට හා ප්‍රජාවට සිදු කිරීමට බලාපොරොත්තු වන සේවාවන් රැසකි. ඩී එන් ඒ අනන්‍යතාව හඳුනා ගැනීමේ (DNA Finger Printing) තාක්ෂණය භාවිත කිරීම, නිවුන්

2 වන පිටුවට...

## "විද්‍යාත්මක පර්යේෂණ සඳහා කලාව"

### නිවුන් ලේඛනාගාරයෙන් සංස්කෘතික වැඩසටහන් පෙළක්...




නිවුන් ඔබ සියලු දෙනාට ම ඉදිරි දිනක දී එක ම ස්ථානයක දී හමු වී දොඩමළු විය හැකි අවස්ථාවක් උදා වනු ඇත. ඒ සඳහා අප යොමු කළේ ඔබ ම ය. නිවුන් පර්යේෂණ සඳහා දත්ත රැස් කිරීමේ දී බහුතර නිවුන් පිරිසක් අප වෙත ප්‍රකාශ කළේ ඔවුන්ට එක ම ස්ථානයක දී හමු වී අදහස් හුවමාරු කර ගත හැකි අවස්ථාවක් සලසා දෙන්නේ නම් එය ඉතා යෝග්‍ය බවයි.


"සංස්කෘතික ක්‍රියාකාරකම් වලින් පර්යේෂණ සඳහා දායකත්වය" (Multiples and twins engage in research through culture) යනු ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය මගින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ "බහු උපත් පදනමේ" සාමාජික සංඛ්‍යාව වැඩි කිරීම වේ. මෙහි තවත් එක් අදියරක් වශයෙන් සංස්කෘතික ප්‍රසංගයක් පැවැත්වීමට අපි බලාපොරොත්තු වෙමු එය නිවුන් ඔබගේ සැඟවුණු දක්ෂතා එළිදක්වීමට ද කදිම අවස්ථාවක් වන බව නොඅනුමාන ය.




මෙම ප්‍රසංගය 2010 වසර අවසානයේ දී පැවැත්වීමට නියමිත ය. මේ අතරතුර කාලයේ දී කථීක, රචනා, චිත්‍ර, කෙටි කථා ආදී තරඟ විවිධ වයස් මට්ටම්වලින් පැවැත්වීමට නියමිත ය. ඊට අමතර ව නිවුන් පුද්ගලයන් යොදා ගෙන කෙටි චිත්‍රපටියක් කිරීමට ද අපි බලාපොරොත්තු වෙමු. පියවරෙන් පියවර පැවැත්වෙන මෙම අවස්ථාවලට සහභාගී වීම සඳහා ශ්‍රී ලාංකීය දීප ව්‍යාප්ත නිවුන් ප්‍රජාවට අපි විවෘත ආරාධනයක් කරන්නෙමු. නිවුන් ඔබගේ විවිධ වූ සංස්කෘතික අංග රැසකින් විචිත්‍රවත් වූ අවසාන මහා උළෙලේ දී එම ජයග්‍රාහක/ ජයග්‍රාහිකාවන්ට සහතික පත්‍ර සහ ත්‍යාග ප්‍රදානය කිරීමට ද අපි බලාපොරොත්තු වෙමු. තරඟ විස්තර, සංස්කෘතික අංග පිළිබඳ විස්තර, යනාදිය පිළිබඳ ව ඉදිරි දිනවල දී මාධ්‍ය ඔස්සේ ඔබ දැනුවත් කෙරෙනු ඇත.

එමෙන් ම මෙම අවස්ථාව ඔබට ද නැවුම් අත්දැකීමක් වනු නො අනුමාන ය. පැවැත්වීමට නියමිත මෙම ක්‍රියාදාමය සඳහා ඔබගේ ද අදහස් ලැබෙන්නේ නම් අපි ඉතා අගය කරමු. ඒ නිසා මේ පිළිබඳ ව ඔබේ අදහස් දැනගැනීමට අප කැමැත්තෙමු. ඒවා අපි වෙත ලිඛිත ව යොමු කරන්න.

***ඔබත්, ඔබේ දක්ෂතා මැන බැලීමට කැමැති නම්, ඔබේ අයැදුම් පත අද ම අප වෙත යොමු කරන්න.***





ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ තොරතුරු දැන ගැනීමට http://www.infolanka.com/org/twin-registry ලිපිනයෙන් අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.

# ශ්‍රී ලංකාවේ බහුල ව පවතින මානසික ගැටලු පිළිබඳ අධ්‍යයනය සාර්ථක ව නිමා විය

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ බහුල ව පවතින මානසික ආබාධ, මත්පැන්, දුම්වැටි භාවිතය සහ සියදිවි හානි කර ගැනීමේ සිතුවිලි යන කරුණු සඳහා ජානමය සහ පාරිසරිකමය සාධක කෙසේ බලපෑම් කරයි ද යන්න ය. ඒ සඳහා සම හා අසම නිවුන් පුද්ගලයන් මෙන් ම නිවුන් නොවන පුද්ගලයන්ගේ සහාය ද අපි ලබා ගත්තෙමු.

මෙම අධ්‍යයන ව්‍යාපෘතිය සඳහා අප ආයතනය, ලන්ඩන් විශ්ව විද්‍යාලයීය මනෝ වෛද්‍ය විද්‍යා ආයතනය (Institute of Psychiatry) සහ ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සමඟ ඒකාබද්ධ ව කටයුතු කළ අතර මේ සඳහා අනුග්‍රහය ලබා දුන්නේ එක්සත් රාජධානියේ The Welcome Trust පුණ්‍යායතනය යි. මෙම අධ්‍යයනය සඳහා ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය විසින් 2004 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කයේ කරනු ලැබූ නිවුන් සංගණනයකින් නිවුන් යුගල 2000ක් තෝරා සහභාගි කරවා ගන්නා ලදි. කොළඹ දිස්ත්‍රික්කය තුළ පමණක් සිදු කරනු ලැබූ මෙම සංගණනයේ දී කොළඹ, රත්මලාන හා තිඹිරිගස්යාය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සංගණනය, ග්‍රාම නිලධාරීන් හා මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මගින් ද දෙහිවල, මොරටුව, කැස්බෑව, හංවැල්ල, කඩුවෙල, කොළොන්නාව, මහරගම, කෝට්ටේ, හෝමාගම හා පාදුක්ක යන කොට්ඨාසවල සංගණනය ග්‍රාම නිලධාරීන් මගින් ද සිදු කළෙමු.

1 වන පිටුවෙන් ...

පුද්ගලයන්ගේ සම අසම බව ඒ අනුව තීරණය කිරීම, අධිකරණ වෛද්‍ය විද්‍යාව සඳහා සේවා සැපයීම, ජාන විද්‍යාව ඇසුරෙන් රෝගාබාධ හඳුනා ගැනීම සහ ජාන වර්ග සඳහා කරන අධ්‍යයනවලට උපකාරී වීම මෙම සේවා අතුරින් ප්‍රධාන වේ.

වර්තමානයේ අප රටේ ජාන තාක්ෂණය යොදා සිදු කරන පර්යේෂණ ඉතා අල්ප බැවින් එවැනි ජාන පරීක්ෂණයක් සිදු කර ගැනීමේ අවශ්‍යතාවක් මතු වූ විටක ඒ සඳහා විදේශිකයන්ගේ සහාය ලබා ගැනීමට සිදු වී ඇත. එහි දී සිදු වන අකටයුතුකම් බොහොමයකි. නමුත් මෙම ජාන විද්‍යාගාරය ස්ථාපිත කිරීමෙන් පසු මෙරට දී ම ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් ලබා දීමේ හැකියාව ඇති අතර ජාන සම්බන්ධ ව සිදු විය හැකි වැරදි අවම කර ගත හැකි වනු ඇතැයි අපි විශ්වාස කරමු. එසේ ම ජාන පර්යේෂණ සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට, දියුණු රටවලට සේ ම අපට ද හැකි වනු ඇතැයි විශ්වාස කරමු.

## අපේ වාර්තා

### කොළඹ දිස්ත්‍රික්කයෙන්

| | |
|---|---|
| තෝරා ගත් ග්‍රාම නිලධාරී කොට්ඨාස | 548 |
| කඩුවෙල/ කොළොන්නාව අධ්‍යයනයෙන් | 59 |
| නිවුන් සංගණනයෙන් (කොළඹ දිස්.) | 9360 |
| ප්‍රධාන නිවුන් දත්ත ලේඛනයෙන් | 6693 |
| **මුළු ගණන** | **16660** |

# බහුල ව පවතින මානසික ගැටලු පිළිබඳ නිවුන් පුද්ගලයින් සමඟ කළ පර්යේෂණයේ ප්‍රතිඵල



මානසික අවපීඩනය හා කාංසාව ශ්‍රී ලංකාවේ වැදගත් මානසික රෝගයක් බව අපගේ පර්යේෂණයෙන් තහවුරු විය. එහෙත් බටහිර රටවල මෙන් බහුල ව මෙම රෝගය නොමැති බව ද මෙම පර්යේෂණය මඟින් සනාථ විය.

මෙහි දී ඔබ විසින් කරන ලද දායකත්වය අතිශයින් ම වැදගත් ය. සියලු ම බටහිර විද්‍යාඥයින් හා වෛද්‍යවරුන් මවිත කරමින් පර්යේෂණයට ආරාධනා ලැබූ නිවුන් පුද්ගලයින් 92%ක්ම පර්යේෂණයට සහභාගි විය. එමෙන් ම සමහරුන් පර්යේෂණයට සහභාගි වන කාලය සඳහා ගෙවූ මුදල ද නැවත පර්යේෂණයට ම පෙරළා පරිත්‍යාග කළහ. එම මුදලින් අපි, දුෂ්කරතාවට පත් වූ දරුවකුට උපකාරයක් කළෙමු. මෙම පර්යේෂණයෙන් මතු වූ තවත් වැදගත් කරුණක් වන්නේ පාරිසරික සාධක, මානසික සෞඛ්‍ය කෙරෙහි ඇති කරන බලපෑමයි. මෙය සංවර්ධිත රටවලට වඩා වෙනස් තත්වයකි. මෙය වඩාත් බලපානුයේ පිරිමින්ට බව ද මෙහි දි හමු වූ වැදගත් කරුණකි.

ශ්‍රී ලංකාව වැනි රටක පිරිමින්ගේ මානසික සෞඛ්‍යයට දරිද්‍රතාවයේ බලපෑම කාන්තාවන්ට වඩා වැඩි වන්නේ ඇයි ද යි අපි තව ම නොදන්නෙමු. අපි නිවුන් පුද්ගලයින් 4024ක් පරීක්ෂණයට භාජනය කළෙමු. ඔවුන්ගෙන් තුන් නිවුන් පුද්ගලයන් 15 දෙනෙක් (යුගල් 5ක්) හමුවූ අතර ඉතිරි අයගෙන් 1954ක් පරිපූර්ණ නිවුන් පුද්ගයෝ වූහ. මොවුන්ගෙන් යුගල් 635ක දෙදෙනා ම පිරිමි වූ අතර යුගල 785ක දෙදෙනා ම ගැහැනු ද යුගල 534ක් මිශ්‍ර ලිංගිකයෝ ද වූහ.

මෙම සාර්ථක පර්යේෂණයේ තවත් ප්‍රතිඵල ඉදිරියේ දී ඔබ හමුවට තැබීමට අප බලාපොරොත්තු වන අතර මෙම පර්යේෂණයෙන් ලැබුණු ජාන පර්යේෂණාගාරය සම්පූර්ණයෙන් ම පාහේ ස්ථාපිත කර තිබේ. අනාගතයේ දී නිවුන් යුගල දෙදෙනා ම පිරිමි හෝ දෙදෙනා ම ගැහැනු අයට ඔවුන්ගේ සම අසම භාවය නිර්ණය කිරීම පිණිස අප විසින් ආරාධනා කරනු ලැබේ.

## උසස් පෙළ ව්‍යාපෘති සඳහා අපෙන් අත්වැළක්

උසස් පෙළ ව්‍යාපෘති සකස් කිරීමේ දී නිවුන් පුද්ගයන් ආශ්‍රයෙන් සිදු කරන ව්‍යාපෘති සඳහා අවශ්‍ය නවතම තොරතුරු අවශ්‍ය නම්,011 2884431/ 011 5662895 යන දුරකථන අංකවලින් අප අමතන්න.

## ලෝකයේ නිවුන්නු සම්බන්ධ අලුත් තොරතුරු

**නිරෝගී දරුවන් අට දෙනෙකු එකවර බිහිකරමින් කුමාර කන්දක් ලැබූ ඇමරිකානු පාර්වතිය.**



මිහිපිට සිටින දෙවියන් කිරිකැටියන් ය. ඔවුන්ගේ සිත් නො කිළිටි ය, පිවිතුරු ය. කුරිරු ලෝකයේ ධර්මතාවන් ගැන ඔවුහු කිසිඳු දෙයක් නො දනිති. එහෙව් කිරි කැටියකුගේ මුහුණ දකීම වුව ද සිතට සැනසීම ලබා දෙයි. මවක සිය අලුත උපන් බිළිඳා දකීමට පෙරුම් පුරන්නේ එහෙයිනි. එක වර එහෙව් කිරිකැටියන් එකකු දෙදෙනෙකු නො ව අට දෙනෙකුගේ මවක වීමට තරම් ඇමරිකානු කාන්තාවක් පසුගියදා වාසනාවන්ත වූවා ය. ඇමරිකාවේ ලොස් ඇන්ජලිස් නුවර "කෙයිසර් බෙල්ෆ්ලවර්" වෛද්‍ය මධ්‍යස්ථානයේ දී පසුගියදා අට නිවුන් දරු උපතක් සිදු විය. මෙම විස්මයජනක පුවත කෙරෙහි කාගේත් අවධානය යොමු වූ අතර දරුවන් දෙවියන් සේ සලකන කාට කාටත් මෙය ඉතා සතුට දනවන ආරංචියක් විය. ගර්භණී අවදියේ දී සිදු කළ පර්යේෂණ මගින් ඇයට දරුවන් 07 දෙනෙකු පිළිසිඳ ගෙන ඇති බවට අනාවරණය විය.

ස්වාභාවික සිද්ධාන්තයන්ට අනුව සිදු වන දරු පිළිසිඳ ගැනීමක දී නම් මෙතරම් විශාල දරුවන් සංඛ්‍යාවක් පිළිසිඳ ගැනීමේ ඉඩ කඩ අඩු ය. මෙවැනි අවස්ථාවක දී බොහෝ විට පිළිසිඳ ගන්නේ එක් දරුවකු හෝ දරුවන් දෙදෙනකු පමණි. විශාල දරුවන් සංඛ්‍යාවක් පිළිසිඳ ගැනීමේ ඉඩ කඩ බොහෝ විට පවතින්නේ කෘත්‍රිම දරු පිළිසිඳ ගැනීමක දී ය. එනම් දරුවන් නොමැති ව සිටි යුවලක් දරුවන් ලබා ගැනීම සඳහා කෘත්‍රිම සංසේචන ක්‍රමයක් භාවිත කරන විටක දී ය. මෙම ක්‍රමයට අමතර ව තවත් කෘතිම පිළිසිඳ ගැනීමේ ක්‍රමවේදයක් වෛද්‍ය විද්‍යාවේ දී භාවිත කෙරේ. එහි දී සිදු කෙරෙනුයේ ඖෂධ වර්ග මගින් ඩිම්බ කෝෂය උත්තේජනයට ලක් කිරීමයි. ක්ලොමිෆෙන් (Clomiphene) නමින් හඳුන්වන ඖෂධ වර්ගය භාවිත කිරීමේ දී සාමාන්‍යයෙන් සිදු වන්නේ සරු ඩිම්බ එකක් හෝ දෙකක් නිපදවීම ය. නමුත් මෙම ඖෂධ වර්ගයේ ම වඩාත් ක්‍රියාකාරී එන්නත් ලබා ගත් විට එම ක්‍රියාදාමය වැඩි පුර සිදු වේ. එවිට සරු ඩිම්බ 08ක් 10ක් ආදී සංඛ්‍යාවක් නිපදවේ. මෙම දරු පිළිසිඳ ගැනීමේ දී ද මෙසේ වැඩි ඩිම්බ සංඛ්‍යාවක් නිපදවී ඇත.

කලින් සිට ම වෛද්‍යවරු කටයුතු සූදානම් කර තිබුණේ දරුවන් 07 දෙනෙකුගේ ප්‍රසූතිය වෙනුවෙනි. එහෙත් සත් වෙනි දරුවා ද ගර්භාෂයෙන් පිටතට ගත් කල තවත් දරුවකු ඒ තුළ සිටින බවට වෛද්‍යවරුන්ට දිස් වී ඇත. මෙය සැබවින් ම විමතියට කරුණක් විය. මෙම දරුවා අනෙකුත් දරුවන්ගෙන් මඳක් ඈතට වන්නට පිළිසිඳ ගෙන සිටින්නට ඇති බව විශ්වාස කෙරේ.


**"රිවිර පුවත් පතෙන්" උපුටා ගත්තකි.**

## කුඩා නිවුන් ලේඛකයෝ

ඉපදුණු දා පටන් මනුෂ්‍ය වර්ගයා කරන කියනා දේ විශ්මිත මෙන් ම අපූර්වත්වයකින් ද යුක්ත ය. එයට සැබෑ අරුතක් එක් වන්නේ කිසිවකු හෝ කුඩා කල සිට ම එවැනි දේ කිරීම නිසාවෙනි. "කළ නොහැක්කක් නොමැත" යන අපූරු කියමන අප කතා නායකයින් දෙදෙනාට අපූරුවට පැහෙන්නේ ඔවුන් සතු ව ඇති විවිධාකාර දක්ෂතාවන් නිසා ය. සමාන හැඩරුවින් යුක්ත, සමාන ව හිතන පතන, සමාන ව අඳින පළඳින මොවුන් දෙදෙනා නමින් ඉසිවර උමයංග කරුණාරත්න හා ඉඳුවර උමයංග කරුණාරත්නයි.

මේ වන විට ළමා සාහිත්‍යයේ නමක් රැඳවීමට තරම් මොවුන්ගේ නිර්මාණ සමත් වී ඇත්තේ එම නිර්මාණ සරල වීම නිසා ම නො ව, මොවුන් දෙදෙනා තවමත් දොළොස් හැවිරිදි වියේ පසු වීම නිසාවෙනි. පළමු ව 2006 වසරේ දී "අයියයි මල්ලියි" නමින් ළමා කථා සංග්‍රහයක් ඉදිරිපත් කර 2008 වසරේ දී "අයියයි මල්ලියි 2 - අපේ කථා" සංග්‍රහය ඉදිරිපත් කිරීමට තරම් ඔවුහු දනුමෙන් හා ලේඛනයෙන් සුපෝෂිත වූහ. ලේඛනයෙන් තම දනුම පෝෂණය කර ගත්තා පමණක් නො ව තම පළමු කථා සංග්‍රහය අලෙවියෙන් ලද සියලු ආදායම තම සිප් හල වූ සිරිමාවෝ බණ්ඩාරනායක ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයේ පුස්තකාල සංවර්ධන අරමුදලට බැර කිරීමට තරම් ඔවුන් කෘතවේදී වූයේ තම සිප් හලෙන් ලද දනුම කිසිදා කිසි ලෙසකින් ලබා ගත නොහැකි වූ නිසා ය.

හෙළ සාහිත්‍ය අම්බරයට පැයූ මෙම තාරකාවන් දෙදෙනා ලේඛනයෙහි දක්වන දක්ෂතාව ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයට අභිමානයක් වන්නේ ඔවුන් නිවුන් දරුවන් වීම නිසා ම නො ව නිවුන් ලේඛනාගාරයේ ලියාපදිංචි එක ම ළමා නිවුන් ලේඛකයන් වීම නිසා ය. එමෙන් ම ලාබාල වියේ දී ම ළමා කථා ලේඛනයට පිවිසි මොවුන් දෙදෙනාගේ දක්ෂතාව තව තවත් උද්දීපනය වී හෙළ සාහිත කෙත පෝෂණය කිරීමට තරම් භාග්‍යය හා ශක්තිය ලැබේ වා යි අපි සියලු දෙනා ප්‍රාර්ථනා කරමු.






## තමිල්නාඩු නිවුන් ලේඛනාගාරය ආරම්භ කිරීමට අපගේ සහාය

ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය හා ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ මහාචාර්ය එම්. ජී. ආර්. වෛද්‍ය විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් පසුගියදා අත්සන් තැබිණි. ඒ තමිල්නාඩුවේ නිවුන් ලේඛනාගාරයක් ආරම්භ කිරීම නිමිත්තෙනි. එහි දී ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය වෙනුවෙන් අපගේ අධ්‍යක්ෂ වෛද්‍ය අතුල සුමතිපාල මහතා ද, එම්. ජී. ආර්. වෛද්‍ය විද්‍යාලය වෙනුවෙන් එහි පීඨාධිපති මහාචාර්ය මීර් මුස්තාෆා හුසෙයින් මහතා ද මෙම ගිවිසුමට අත්සන් තැබූහ. මේ අවස්ථාවට මදුරාසි නගරාධිපතිතුමා ද විශ්වවිද්‍යාල ප්‍රජාව ද නගර වැසියන් රාශියක් ද සහභාගී විය. තමිල්නාඩුවේ, බටහිර වෛද්‍ය විද්‍යාව මෙන් ම දේශීය වෛද්‍ය විද්‍යාව සම්බන්ධ අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය සිදු කරන්නේ ද මෙම එම්. ජී. ආර්. වෛද්‍ය විද්‍යාලය මඟිනි. එසේ ම නිවුන් පර්යේෂණ ක්ෂේත්‍රයේ අප දැනට ඉදිරියෙන් සිටින බව නිහතමානී ව සඳහන් කරන අතර, සායනික ජාන විද්‍යා ක්ෂේත්‍රයේ ඔවුහු අපට වඩා ඉදිරියෙන් සිටිති. එම නිසා අපගේ මෙම සම්බන්ධතාවන් අන්‍යෝන්‍ය වශයෙන් දෙරටට ම වාසි සහගත වේ.

මෙම ගිවිසුම ඇති කිරීමට පුරෝගාමී මෙහෙවරක් ඉටු කරන ලද්දේ එම්. ජී. ආර්. වෛද්‍ය විද්‍යාලයේ සායනික ජාන විද්‍යාව (Clinical Genetics) හා ළමා රෝග පිළිබඳ මහාචාර්යවරියක වන ලක්ෂ්මි නාරායන මැතිනියයි.

## නිවුන්නු ජෝඩු සියයක් ඇති ඉන්දියාවේ කොන්ඩින්ජිනි ගම

නිවුන්නු අධික ව සිටින සමහර ගම්මාන ඉන්දියාවේ පවතින බැව් පසුගිය දිනෙක සති අන්ත පුවත් පතක් වාර්තා කර තිබිණි. එහි සඳහන් පරිදි ඉන්දියාවේ කේරළයේ මාලපුරම් ප්‍රදේශයේ පිහිටි **කොන්ඩින්ජිනි** ගමේ නිවුන්නු යුගල් සියයක් පමණ සිටින බව වාර්තා විය. එම ගමේ පාසලේ පමණක් නිවුන් දරුවන් යුගල 50ක් පමණ ඉගෙන ගන්නා බවත්, ඔවුන්ව වෙන් කර හඳුනා ගැනීමේ ගැටලුව නිසා ගුරුවරුන් ද මහත් අපහසුවට පත් වන බවත් එහි වාර්තා විය. තව ද මෙම ගමේ සිටින නිවුන්නුන්ගෙන් සියයට අනූවක් ම පසුගිය වසර විස්ස තුළ ඉපදුණු අය වන අතර මෙහි වැඩිපුර ම ඇත්තේ එක ම ලිංගයට අයත් නිවුන් යුගල් ය.

### මහඟු සත්කාරයකට ඔබත් දායක වන්න ...

ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය වෙත නිවුන් දරුවන්ට ඇති අපහසුතා දක්වමින් මේ වන විට ලිපි රාශියක් ලැබී ඇත. ඔවුන්ට යම් පමණකින් හෝ ආධාරයක් ලබා දීමට ඔබත් කැමති නම්, අප හා එක්වන්න.

### ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ ලියාපදිංචි වී නොමැති නිවුන් ඔබ සඳහා අයදුම්පත

නම
(1) ............................................................ ස්ත්‍රී/පුරුෂ (1) ..............................................
(2) ............................................................ (2) ..............................................

නිවුන් පුද්ගලයන්ගේ ලිපිනය (1) ......................................................................................
(2) ......................................................................................

දුරකථන අංක (1) ......................................................................................
(2) ......................................................................................

පදිංචි ප්‍රා.ලේ. කොට්ඨාශය (1) .................................... (2) ..............................

පදිංචි දිස්ත්‍රික්කය (1) .................................... (2) ..............................

උපන් දිනය ............................................ වයස ..............................

අත්සන (1) ........................................ (2) ....................................

නිවුන් යුගල වයස 18 ට අඩු නම් මව හෝ පියාගේ අත්සන ..............................

තොරතුරු සපයන අයගේ නම සහ ලිපිනය ......................................................
......................................................................................................

උප්පැන්න සහතිකය අමුනා නොමැති නම්, තොරතුරු සත්‍ය බවට සහතික කරන අයගේ නම සහ ලිපිනය ......................................................
......................................................................................................

# නිවුන්
පුවත්

වෙත

.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................

ආපසු

**ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය**
නො. 762/4B, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

නිවුන් පුද්ගලයන් අතර බෙදා හැරීම පිණිස ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරය විසින් ........................ දරණ ස්ථානයේ .......................... දී මුද්‍රණය කරවන ලදී.